සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2026**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2026**
**General Certificate of Education (Adv. Level) Examination, 2026**

| | | |
|---|---|---|
| **බුද්ධ ධර්මය I**<br>பௌத்தம் I<br>Buddhism I | **41 S I** | *පැය දෙකයි*<br>*இரண்டு மணித்தியாலம்*<br>*Two hours* |

***උපදෙස්:***

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබගේ **විභාග අංකය** ලියන්න.
* උත්තර පත්‍රයේ, පිටුපස දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
* ප්‍රශ්න අංක **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට **නිවැරදි හෝ වඩාත් ම ගැළපෙන හෝ** පිළිතුර (1), (2), (3), (4), (5) යන වරණ අතුරෙන් තෝරාගෙන, එය **උත්තර පත්‍රයේ පසුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක් (×) යොදා දක්වන්න.**

**1.** නව අරහාදී බුදුගුණ ඇතුළත් ගාථා පාඨයෙහි විජ්ජාචරණසම්පන්න බුදුගුණයෙහි අන්තර්ගත අෂ්ට විද්‍යාවන්ගෙන් එකක් නම්
(1) ආසයානුසය ඤාණයයි. (2) ඨානාට්ඨාන ඤාණයයි.
(3) සබ්බත්ථගාමිණීපටිපදා ඤාණයයි. (4) කම්මවිපාක ඤාණයයි.
(5) මනෝමයඉද්ධි ඤාණයයි.

**2.** මහාසීහනාද සූත්‍රය අනුව බුදුරජාණන් වහන්සේ දසවිධ ඤාණ බලයෙකින් යුක්ත වූ අතර එයින් එකක් නම්
(1) ආසවක්ඛය ඤාණයයි. (2) අකම්පන ඤාණයයි.
(3) අනාවරණ ඤාණයයි. (4) ඉද්ධිවිධ ඤාණයයි.
(5) සබ්බඤ්ඤුත ඤාණයයි.

**3.** තමන් වහන්සේ හැඳින්වීමට සුදුසු නාමය ‘බුද්ධ’ යන්න බව බුදුරදුන් විසින් ම ප්‍රකාශ කරන ලද්දේ,
(1) අරියපරියේසන සූත්‍රයේදී ය. (2) ද්‍රෝණ සූත්‍රයේදී ය.
(3) ධම්මචක්කප්පවත්තන සූත්‍රයේදී ය. (4) මහාගෝවින්ද සූත්‍රයේදී ය.
(5) නිබ්බේධික සූත්‍රයේදී ය.

**4.** ඉතා ප්‍රියශීලී ශාස්තෘවරයෙකු වූ බුදුරදුන් තමන්වහන්සේ හමුවට එන්නවුන් පළමුව නිහතමානීව අමතන බව සිය පිරිසට ප්‍රකාශ කරන ලද්දේ,
(1) කොසොල් රජතුමා විසිනි. (2) විශාඛා උපාසිකාව විසිනි.
(3) ආනන්ද මහතෙරුන් විසිනි. (4) රජගහනුවර සිටුතුමා විසිනි.
(5) සෝණදණ්ඩ බමුණා විසිනි.

**5.** බුදුරජාණන් වහන්සේ විසින් ධර්මානුශාසනා සිදු කළ ක්‍රම හතරක් ගැන මහාවග්ගපාළියේ දැක්වේ. ඉන් එක් ක්‍රමයක් වන අට්ඨුප්පත්තික යන්නෙන් අදහස් කෙරෙන්නේ,
(1) යම් කරුණක් විභේදනය කරමින් අර්ථකථනය කිරීමයි.
(2) යම් සිද්ධියක් මුල් කරගෙන ධර්ම දේශනා කිරීමයි.
(3) පුරාවෘත්තයක් ගෙනහැර පා ධර්ම දේශනා කිරීමයි.
(4) ශ්‍රාවකයන්ගේ අපේක්ෂාව අනුව ධර්ම දේශනා කිරීමයි.
(5) අට ආකාරයකින් කිසියම් ධර්ම කරුණක් ප්‍රකාශ කිරීමයි.

**6.** “අභික්කන්තං භො ගොතම, අභික්කන්තං භො ගොතම”යනාදී වශයෙන් බුද්ධ දේශනාවට සවන් දුන් බොහෝ ශ්‍රාවකයන් අවසානයේ ප්‍රසාදයට පත්ව කළ ඇගයීම් පෙළ දහමෙහි වාර්තා වේ. එබඳු එක් අවස්ථාවක් හමුවන්නේ,
(1) මෙත්ත සූත්‍රයේදී ය. (2) කසීභාරද්වාජ සූත්‍රයේදී ය.
(3) මහාපරිනිබ්බාන සූත්‍රයේදී ය. (4) සච්චවිභංග සූත්‍රයේදී ය.
(5) බ්‍රහ්මජාල සූත්‍රයේදී ය.

[දෙවැනි පිටුව බලන්න.

Past Papers Wiki



7. විනය පිටකය හඳුන්වා දෙමින් එක් ශිෂ්‍යයෙක් ලියූ වාක්‍ය පහකින් එකක් පමණක් නිවැරදි විය. එම වැකිය නම්,
   (1) විනය පිටකය ගිහිපැවිදි දෙපක්ෂයට ම අදාළ ය.
   (2) නූල යන අර්ථයෙන් විනය යැයි කියනු ලැබේ.
   (3) භික්ෂු සමාජය ආරම්භයේදී ම විනය පනවන ලදී.
   (4) විනය පිටකය අදාළ වන්නේ සාමණේර - උපසම්පදා භික්ෂූන්ට පමණි.
   (5) භික්ෂූන් උපවැදි වීම වැළැක්වීමට ද විනය නීති පනවා ඇත.

8. අභිධර්ම ප්‍රකාරණයක් වූ ධම්මසංගණිය තුළ විස්තර වන කරුණු අතරට ඇතුළත් **නොවන්නේ,**
   (1) අභිධම්ම මාතිකා ය.
   (2) නාම ධර්මයෝ ය.
   (3) සුත්තන්ත මාතිකා ය.
   (4) සූවිසි ප්‍රත්‍යයෝ ය.
   (5) භූතරූපයෝ ය.

9. දුතියසන්දිට්ඨික සූත්‍රය අනුව ධර්ම රත්නයෙහි සවැදෑරුම් ගුණ අතුරෙන් සන්දිට්ඨික යන්නෙන් අදහස් වන්නේ,
   (1) බුදුදහම වෙනත් කවර දහමකට වුව ද උපමා කළ නොහැක යන්නයි.
   (2) නිවැරදි න්‍යායාත්මක දහමක් වේය යන්නයි.
   (3) ධර්මය සිතට පමුණුවාගෙන අත්දැකිය යුතුය යන්නයි.
   (4) ඇස් පනාපිට ම තමාට ම දැන දැක ප්‍රතිඵල උදාකර ගත හැකිය යන්නයි.
   (5) මනාකොට ප්‍රකාශිත දහමක් යන්නයි.

10. බුදුදහම දේව අනාවරණයක් නොව බුදුරදුන් මනා කැපවීමෙන් සිදු කළ සත්‍ය ගවේෂණයෙහි ප්‍රතිඵලයක් බව අවධාරණය වන්නේ,
   (1) මහාපරිනිබ්බාන සූත්‍රයෙනි.
   (2) අරියපරියේසන සූත්‍රයෙනි.
   (3) ධම්මදායාද සූත්‍රයෙනි.
   (4) අච්ඡරියබ්භූත සූත්‍රයෙනි.
   (5) ධම්මචේතිය සූත්‍රයෙනි.

11. බුද්ධකාලීන භාරතීය ශ්‍රමණ සම්ප්‍රදායට අයත් ජටිල පැවිද්දන් හැඳින්විය හැක්කේ,
   (1) නිරුවත් තවුසන් ලෙස ය.
   (2) පිරිවැජි පිරිසක් ලෙස ය.
   (3) ජටාධරයන් ලෙස ය.
   (4) ජෛන ශ්‍රාවකයන් ලෙස ය.
   (5) ආජීවකයන් ලෙස ය.

12. භික්ෂු සමාජය ප්‍රභවය වූයේ විවිධ කරුණු රාශියක් පාදක කරගෙන ය. ඒ අතුරෙන් වඩා නිවැරදි කරුණ ලෙස සැලකිය හැක්කේ,
   (1) බමුණු මතවලට අභියෝග කළ හැකි සංවිධානයක අවශ්‍යතාව මත ය.
   (2) ආධ්‍යාත්මික සංවර්ධනය මුඛ්‍ය පරමාර්ථය කොටගත් බෞද්ධ පැවිද්දන්ගේ එකමුතුවක අවශ්‍යතාව මත ය.
   (3) ශ්‍රමණ පැවිද්දන්ගේ චර්යාවන්ට එරෙහිව ය.
   (4) ගිහි සමාජයට නිසිමග පෙන්වාදීමේ එක ම අවශ්‍යතාව මත ය.
   (5) සමකාලීන රාජ්‍ය පාලකයන්ගේ බලපෑම මත ය.

13. භික්ෂු-භික්ෂුණී උභය සංඝයා උදෙසා බුදුරදුන්ගේ අනුදැනීම මත ක්‍රියාත්මක වූ විවිධ උපසම්පදා ක්‍රම අතර එක් භික්ෂුණියක උදෙසා පමණක් 'දූතේන උපසම්පදා' ක්‍රමය භාවිත වූ බව සඳහන් වේ. එම භික්ෂුණිය නම්,
   (1) ප්‍රජාපතී ගෝතමී තෙරණියයි.
   (2) සුගලා තෙරණියයි.
   (3) අඩ්ඪකාසි තෙරණියයි.
   (4) යසෝධරා තෙරණියයි.
   (5) පටාචාරා තෙරණියයි.

14. භික්ෂු ප්‍රාතිමෝක්ෂයේ දැක්වෙන විනය ශික්ෂාවන් එම ආපත්තිවල ස්වභාවය අනුව කොටස් හතකට වර්ග කර තිබේ. ඒ අතුරෙන් එකක් වන්නේ,
   (1) අනියත
   (2) නිස්සය
   (3) ආසවට්ඨානීය
   (4) උක්ඛේපනීය
   (5) පබ්බාජනීය

15. බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවක සංඝරත්නය දක්ඛිණෙය්‍ය ගුණයෙන් යුක්ත ය. ඉන් අදහස් වන්නේ උන්වහන්සේලා,
   (1) ප්‍රදක්ෂිණා කොට වැඳීමට සුදුසු බව ය.
   (2) දුරබැහැර සිට වුව ද සිවුපසය ගෙන ගොස් පිළිගැන්වීමට සුදුසු බව ය.
   (3) පරලොව සැප පතා දෙනු ලබන දානය පිළිගැනීමට සුදුසු බව ය.
   (4) ඥාතීන්ට පිරිනැමීමට පිළියෙල කරන ලද ප්‍රත්‍ය වුව ද පිළිගැන්වීමට සුදුසු බව ය.
   (5) කෙලෙස් සමනය කරන මග වැඩීමට සුදුසු වන බව ය.

[තුන්වැනි පිටුව බලන්න.

**16.** ආනන්ද මාහිමියන් විසින් මහානාම ශාක්‍යයන්ට පැහැදිලි කළ පරිදි මහාසංඝයා විසින් පිරිය යුතු සේඛ පටිපදාවට ඇතුළත් ශීලය නම්,
(1) ප්‍රාතිමෝක්ෂ සංවර ශීලයයි. (2) චූල ශීලයයි.
(3) පැවිදි දශ ශීලයයි. (4) ආජීව අෂ්ටමක ශීලයයි.
(5) උපෝසථ ශීලයයි.

**17.** සමකාලීනව සම්භාවිත වූ ඊශ්වර නිර්මාණවාදී සංකල්පය බුදුසමය විසින් බැහැර කරන ලද්දේ,
(1) බමුණු මතයක් වන බැවිනි.
(2) දසවස්තුක මිථ්‍යාදෘෂ්ටියට අයත්වන බැවිනි.
(3) එමගින් හේතුඵල ධර්මය බැහැරවන බැවිනි.
(4) එයින් පුබ්බේකතහේතුවාදයක් තහවුරු වන බැවිනි.
(5) එය තර්කානුකූල නොවන බැවිනි.

**18.** බුද්ධකාලීන භාරතීය නාස්තිකවාදය පිළිබඳ පහත දැක්වෙන විවරණවලින් නිවැරදි වන්නේ,
(1) එය පකුධ කච්චායනගේ ඉගැන්වීමකි, යන්නයි.
(2) එය උච්ඡේද දෘෂ්ටියෙන් උපන්නකි, යන්නයි.
(3) එමගින් ආත්මවාදයට අනුබල ලැබේ, යන්නයි.
(4) එය අත්තකිලමථානුයෝගයට අයත් වේ, යන්නයි.
(5) එමගින් සියල්ල කර්මයෙන් සිදුවේ යැයි සැලකේ, යන්නයි.

**19.** සංජය බෙල්ලට්ඨිපුත්තගේ වාචසික පඤ්ච නිෂේධන ක්‍රමයට ඇතුළත් වන්නේ,
(1) සබ්බං උච්ඡිජ්ජති යන්නයි. (2) සබ්බං නත්ථි යන්නයි.
(3) සබ්බං එකත්තං යන්නයි. (4) එවංතිපි මෙ නො යන්නයි.
(5) සබ්බං පුථුත්තං යන්නයි.

**20.** ප්‍රථමාභිසම්බෝධි සමය ගෙවීයත් ම භික්ෂු, භික්ෂුණීන් සඳහා ශික්ෂාපද පැනවීමේ අවශ්‍යතාව උපන් අතර, එයට තුඩු දුන් රත්තඤ්ඤුමහත්තතා යන්නෙන් කියැවෙන්නේ,
(1) උගත්කමින් වැඩි භික්ෂූන් බහුල වීම ය.
(2) භික්ෂූන්ට බොහෝ ලාභ ප්‍රයෝජන ලැබීම ය.
(3) චිරරාත්‍රඥ භික්ෂූන් බහුල වීම ය.
(4) කීර්තිමත් භික්ෂූන් බොහෝ වීම ය.
(5) භික්ෂු සමාජය පුළුල් වීම ය.

**21.** ස්වකීය ශ්‍රාවකයන්ගේ ධර්ම දේශනා කුසලතා අගය කිරීමට බුදුරදුන් බොහෝවිට පෙළඹී ඇති බව පෙළදහමින් පෙනේ. ඒ අනුව සච්චවිභංග සූත්‍ර දේශනාවෙන් පසු චතුරාර්ය සත්‍යය මැනවින් පැහැදිලි කිරීම පිළිබඳව බුදුරදුන් ප්‍රශංසා කර ඇත්තේ,
(1) ආනන්ද මාහිමියන්ට ය.
(2) මහා කච්චාන මාහිමියන්ට ය.
(3) මහා කාශ්‍යප මාහිමියන්ට ය.
(4) පුණ්ණමන්තානිපුත්ත මාහිමියන්ට ය.
(5) සැරියුත් මාහිමියන්ට ය.

**22.** අග්ගඤ්ඤ සූත්‍රාගත සමාජ පරිණාමය පිළිබඳ වෘත්තාන්තයෙන් **නොකියවෙන** කරුණ වන්නේ,
(1) සමාජ සංස්ථා බිහිවන්නේ මානව ක්‍රියාකාරකම් අනුවය, යන්නයි.
(2) සියල්ල හේතුඵල දහමට අනුව සිදුවේ, යන්නයි.
(3) මිනිස් මනසේ ක්‍රියාකාරිත්වය සමාජ විෂමතා ඇති කරයි, යන්නයි.
(4) සත්ත්වයා හා ලෝකය පරිණාමයට පත්වන්නේ අදෘශ්‍යමාන බලයකිනි, යන්නයි.
(5) පරිසරය මිනිසාටත්, මිනිසා පරිසරයටත් බලපායි, යන්නයි.

**23.** පැවිදි ශ්‍රාවකයන් ධර්මදූත කාර්යයෙහි උනන්දු කළ බුදුරජාණන් වහන්සේ උන්වහන්සේලාගේ දක්ෂතා අගයමින් විවිධ තනතුරුවලට පත් කළහ. එහිදී විචිත්‍ර ධර්ම කථිකයන් අතර අගතනතුර ප්‍රදානය කරන ලද්දේ,
(1) උපාලි තෙරුන්ට ය. (2) කුමාර කාශ්‍යප තෙරුන්ට ය.
(3) මහාකාශ්‍යප තෙරුන්ට ය. (4) ආනන්ද තෙරුන්ට ය.
(5) නන්දක තෙරුන්ට ය.

Past Papers Wiki



**24.** සසුනේ යහපැවැත්ම පිණිස භික්ෂූන් වහන්සේලා සාමූහිකව ගත යුතු ක්‍රියාමාර්ග රැසක් අනුදැන වදාළ බුදුරදුන්, ඒ අතරට ඇතුළත් කර ඇති කරුණක් නම්,
(1) වෙහෙර විහාර ගොඩනැංවීමයි.
(2) දහම් පොතපත සම්පාදනයයි.
(3) ප්‍රාතිමෝක්ෂ සංවරයෙන් සංවර වීමයි.
(4) අඩමසක් පාසා රැස් වී පොහොය පවුරුණු කිරීමයි.
(5) ගිහි ප්‍රජාවට ධර්මය ඉගැන්වීමයි.

**25.** ප්‍රථම ධර්ම සංගායනාව අවසානයේදී ඛුද්දානුඛුද්දක ශික්ෂාපද මොනවා දැයි භික්ෂූන් අතර ඒකමතිකත්වයක් නොවූ විට, මහාකාශ්‍යප මහතෙරුන් වහන්සේ ප්‍රකාශ කළේ,
(1) මතුවට නැවත සාකච්ඡා කොට තීරණයකට එළඹිය හැකි බවයි.
(2) ඛුද්දානුඛුද්දක යැයි වෙන්කොට නොගෙන සියලු ශික්ෂාපද ආරක්ෂා කිරීම සුදුසුය, යන්නයි.
(3) එම ශික්ෂාපද සමූහනය කළ යුතු බවයි.
(4) සතර පාරාජිකාදී ගරුකාපත්ති හැර සෙසු සියලු ශික්ෂාපද ඛුද්දානුඛුද්දක වන බවයි.
(5) බුදුරදුන් පැනවූ ශික්ෂාපද ගැන තීරණ ගැනීමට භික්ෂූන්ට අයිතියක් නැති බවයි.

**26.** තෙවන ධර්ම සංගීතිය නිම කරමින් සම්පාදනය කරන ලද විශේෂ ප්‍රකරණයක් අභිධර්ම පිටකයට එක් කරන ලද බව ඓතිහාසික ශාසනික වාර්තාවල දැක්වේ. එම ප්‍රකරණය නම්,
(1) නෙත්තිප්‍රකරණයයි.
(2) විභංගප්‍රකරණයයි.
(3) කථාවත්ථුප්‍රකරණයයි.
(4) පට්ඨානප්‍රකරණයයි.
(5) යමකප්‍රකරණයයි.

**27.** බුදුදහම අනුව පහත දැක්වෙන ප්‍රකාශ අතුරෙන් කුමක් නිවැරදි ද?
(1) අනාත්ම යනු ආත්මය මරණින් කෙළවර වීම ය.
(2) ආත්මයක් ඇතත් එය මරණින් පසු කෙළවර නොවීම අනාත්ම නම් වේ.
(3) ස්කන්ධාදී සමවායක් මිස ආත්මයක් නැත.
(4) ආත්ම දෘෂ්ටිය උච්ඡේදවාදයේ පදනම ය.
(5) නිවන් දක්නා තුරු ආත්මය සසර ගමන් කරයි.

**28.** සත්ත්වයා හා ලෝකය ධාතු හයකට බෙදා දක්වමින් යථාර්ථය පැහැදිලි කරන අවස්ථාවක් දක්නට ලැබෙන සූත්‍ර දේශනාවක් නම්,
(1) ධාතුසංසන්දන සූත්‍රයයි.
(2) ධාතුනානත්ත සූත්‍රයයි.
(3) ධාතුවිභංග සූත්‍රයයි.
(4) ඉන්ද්‍රියභාවනා සූත්‍රයයි.
(5) කෝසම්බිය සූත්‍රයයි.

**29.** විඤ්ඤාණය හඳුන්වා දෙමින් ලියා තිබූ පහත දැක්වෙන වාක්‍ය පහෙන් එකක් පමණක් නිවැරදි ය. එම නිවැරදි වාක්‍යය නම්,
(1) නිවැරදි අවබෝධය විඤ්ඤාණයයි.
(2) විඤ්ඤාණය නාමධර්ම ගණයට අයත් නොවේ.
(3) මනා දැනඋගත්කම විඤ්ඤාණය නම් වේ.
(4) විඤ්ඤාණය යනු මතකයයි.
(5) අරමුණු දැනගැනීම විඤ්ඤාණයයි.

**30.** ශ්‍රී සුමංගල ශබ්දකෝෂය අනුව ද්වාදසායතනයෙහි දැක්වෙන ‘ආයතන’ ශබ්දයෙන් ප්‍රකට වන අර්ථයක් ලෙස සැලකිය **නොහැක්කේ**,
(1) සසර දික් කිරීමට ඉවහල් වීම යන්නයි.
(2) නිවාසස්ථානය යන්නයි.
(3) කාරණය යන්නයි.
(4) උත්පත්තිස්ථානය යන්නයි.
(5) විවිධ සේවාවන් සපයන ස්ථානය යන්නයි.

**31.** පුද්ගලයන් අතර අන්‍යෝන්‍ය සම්බන්ධය සුරක්ෂිතව හා ඵලදායකව පැවැත්වීමට උපකාරී වන යුතුකම් හා වගකීම් සිගාලෝවාද සූත්‍රයේ සදිසා නමස්කාරයෙන් ප්‍රකට කෙරේ. එම සදිසාවන්ට අදාළ **නොවන** කරුණ,
(1) මව්පිය දූදරු සම්බන්ධයයි.
(2) ස්වාමි සේවක සම්බන්ධයයි.
(3) අඹු සැමි සම්බන්ධයයි.
(4) පාලක පාලිත සම්බන්ධයයි.
(5) ගිහි පැවිදි සම්බන්ධයයි.

**32.** වනයෙහි වසන මහඇතෙකුගේ පා සටහන් තුළ ඕනෑ ම වනගත සතෙකුගේ පා සටහනක් ඇතුළත් කළ හැකි වන්නා සේ චතුරාර්ය සත්‍යය තුළට ඕනෑ ම බෞද්ධ ඉගැන්වීමක් ඇතුළත් කළ හැකි යැයි පෙන්වා දී ඇත්තේ,
(1) චූළහත්ථිපදෝපම සූත්‍රයේ ය. (2) හත්ථාරෝහ සූත්‍රයේ ය.
(3) හත්ථක ආලවක සූත්‍රයේ ය. (4) මහාහත්ථිපදෝපම සූත්‍රයේ ය.
(5) හත්ථිපාල ජාතකයේ ය.

**33.** දුක්ඛ නිරෝධය හෙවත් නිවන හැඳින්වීමට පෙළදහම අනුව දැක්විය හැකි පදයක් නම්
(1) සංඛත (2) ජාත (3) කත (4) භූත (5) අභූත

**34.** කාමසුඛල්ලිකානු යෝගය යනු උපරිම වශයෙන් කම්සුව විඳිය යුතුය යන අදහසයි. එයට පෙළඹවීමක් ඇති **නොකරන** ඉගැන්වීම වන්නේ,
(1) ලෝකායතවාදයයි. (2) අකිරියවාදයයි.
(3) නාස්තිකවාදයයි. (4) ආත්මවාදයයි.
(5) උච්ඡේදවාදයයි.

**35.** ශාස්වත-උච්ඡේද යන අන්තගාමී දෘෂ්ටි දෙක ම බුදුසමය පසෙකින් තබන්නේ,
(1) ඒවා එකිනෙකට ප්‍රත්‍ය වන නිසා ය.
(2) දුකින් මිදීමට උපකාරී නොවන නිසා ය.
(3) ශ්‍රමණ බ්‍රාහ්මණාදීන් විසින් පිළිගෙන තිබුණු නිසා ය.
(4) සමකාලීන දෙසැට දෘෂ්ටියට ම ඒවා පාදක වූ නිසා ය.
(5) තර්කානුකූල නොවන නිසා ය.

**36.** දසවැදෑරුම් වූ ලෞකික සම්මාදිට්ඨියට ඇතුළත් වන එක් කරුණක් නම්,
(1) දුන් දෙයෙහි විපාක නැත, යන්නයි.
(2) පරිත්‍යාගය ප්‍රතිඵල රහිතය, යන්නයි.
(3) ඕපපාතික සත්ත්වයෝ ඇත, යන්නයි.
(4) පරලොවක් නැත, යන්නයි.
(5) පූජාවෙහි විපාක නැත, යන්නයි.

**37.** ද්වාදසාංගික පටිච්චසමුප්පාද විග්‍රහය තුළ දැක්වෙන 'ජරා' යන්නෙහි නිවැරදි අර්ථය නම්,
(1) කායික අපවිත්‍ර බව ය.
(2) සිත්සතන්හි කෙලෙස් බහුල වීම ය.
(3) මානසික අපිරිසිදුකම ය.
(4) ඉන්ද්‍රියයන්හි පැසුණු බව ය.
(5) ඒ ඒ සත්ත්ව නිකාය තුළ ඉපදීම ය.

**38.** පහත දැක්වෙන පද අතුරෙන් සංස්ථාගත දුක ප්‍රකාශ වන පදයක් ලෙස හැඳින්විය හැක්කේ,
(1) දොම්නස යන්නයි. (2) අසහනය යන්නයි.
(3) විරැකියාව යන්නයි. (4) අතෘප්තිය යන්නයි.
(5) චිත්තපීඩාව යන්නයි.

**39.** බුදුදහම අනුව පුද්ගල ස්වච්ඡන්දතාවට ප්‍රතිවිරුද්ධ ඉගැන්වීමක් ප්‍රකාශ වන පාඨය ලෙස සැලකිය හැක්කේ,
(1) ආරභථ නික්ඛමථ යුඤ්ජථ බුද්ධසාසනෙ යන්නයි.
(2) උට්ඨානවිරියාධිගතෙහි බාහාබලපරිචිතෙහි සෙදාවක්ඛිත්තෙහි යන්නයි.
(3) අත්තාහි අත්තනො නාථො යන්නයි.
(4) අත්තනාව ජානෙය්‍යාථ යන්නයි.
(5) නත්ථි පුරිසථාමො, නත්ථි පුරිසබලං, නත්ථි විරියං ... යන්නයි.

**40.** "මහණෙනි, මම චේතනාව කර්මය යැයි කියමි. චේතනාව අනුව ම කයින්, වදනින්, මනසින් කර්ම කරනු ලැබේ" මෙම ප්‍රකාශය දැක්වෙන්නේ,
(1) අම්බලට්ඨික රාහුලෝවාද සූත්‍රයේ ය.
(2) මඛාදේව සූත්‍රයේ ය.
(3) වීමංසක සූත්‍රයේ ය.
(4) නිබ්බෙධික සූත්‍රයේ ය.
(5) වේළුද්වාර සූත්‍රයේ ය.

Past Papers Wiki



**41.** ආජීව අෂ්ටමක ශීලය එනමින් හැඳින්වෙන්නේ,
(1) මිථ්‍යා ආජීවයෙන් වැළකීමේ ශික්ෂාපදය අටවැනිව සමාදන් වන බැවිනි.
(2) මිථ්‍යා ආජීවයෙන් වැළකීම අටවැදෑරුම් ආනිශංස ගෙන දෙන බැවිනි.
(3) වැරදි ජීවන පිළිවෙත් අටක් එමගින් ප්‍රතික්ෂේප වන බැවිනි.
(4) මිථ්‍යා ආජීවයෙන් වැළකීම සම්මා ආජීවය වන බැවිනි.
(5) පඤ්චශීලය හැරුණු විට ගිහියා විසින් සමාදන් විය යුතු ප්‍රධාන ශික්ෂා පද අට එය වන බැවිනි.

**42.** පඤ්චශීලයේ දැක්වෙන තෙවැනි සිල් පදයෙන් කියැවෙන්නේ,
(1) නිවැරදිව පස්කම් සැප විඳීමයි.
(2) වැරදි ස්ත්‍රී පුරුෂ ඇසුරින් මිදීමයි.
(3) බ්‍රහ්මචාරී ජීවන ප්‍රතිපදාවයි.
(4) පඤ්චකාමයෙහි නොඇලීමයි.
(5) කාමසුඛල්ලිකානුයෝගී ප්‍රතිපදාව බැහැර කිරීමයි.

**43.** බුදුදහම අනුව සද්ධානුසාරී, ධම්මානුසාරී ශ්‍රාවකයා ආර්යභාවයට පත් වූ පසු ඇතිවන පැහැදීම හඳුන්වනු ලබන්නේ,
(1) චල සද්ධා යනුවෙනි.
(2) අචල සද්ධා යනුවෙනි.
(3) අමූලිකා සද්ධා යනුවෙනි.
(4) අවෙච්චප්පසාද යනුවෙනි.
(5) සම්පසාදනලක්ඛණ සද්ධා යනුවෙනි.

**44.** ධනය පිළිබඳ බෞද්ධ ආකල්පයට පටහැනි ප්‍රකාශය ලෙස සැලකිය හැක්කේ මින් කුමක් ද?
(1) ගිහියා දිවිපැවැත්ම උදෙසා ධනය උපදවා ගත යුතු බව බුදුසමය පිළිගනියි.
(2) භෞතික ධනධාන්‍යාදිය ගිහියන් විසින් කෙසේ හෝ සම්පාදනය කළ යුතු ය.
(3) මිථ්‍යා දිවිපැවතුම් හැරපියා සම්‍යග් පැවැතුම් මගින් ධනය උපදවා ගත යුතු ය.
(4) උත්සාහයෙන් වීර්යයෙන් බාහුබලයෙන් සම්පත් ඉපයීම උතුම් ය.
(5) අගතියෙන්, මුසපත් බවින් හා සාහසිකව ඉපයීම නොකළ යුතු ය.

**45.** ධන ධාන්‍යාදී භෞතික සම්පත් රැකගැනීමත් නිසි කළමනාකරණයත් උදෙසා කූල සූත්‍රය ලබාදෙන උපදේශ අතුරෙන් එකක් නම්,
(1) විධිමත්ව ගණන් හිලවු තබා ගැනීමයි.
(2) අනවශ්‍ය දෙයට වියපැහැදම් නොකිරීමයි.
(3) අසීමිත තණ්හාවෙන් මූර්ඡා නොවීමයි.
(4) සම්පත් භාවිතයෙන් වැරදි නොකිරීමයි.
(5) සිල්වත් ස්ත්‍රියක හෝ පුරුෂයෙකු හෝ නායකත්වයේ තබා කටයුතු කිරීමයි.

**46.** කාමභෝගී ගෘහස්ථයාට ධනහීන බව දුකකැයි බුදුරදුන් විසින් පැහැදිලි කරනු ලැබ ඇත්තේ,
(1) ව්‍යග්ඝපජ්ජ සූත්‍රයේදී ය.
(2) පත්තකම්ම සූත්‍රයේදී ය.
(3) ඉණ සූත්‍රයේදී ය.
(4) අනණ සූත්‍රයේදී ය.
(5) රාසිය සූත්‍රයේදී ය.

**47.** ධනයේ සුරක්ෂිතතාවත් සම්පත් කළමනාකරණයත් උදෙසා පඤ්චබලි සංකල්පය ඉදිරිපත් කරන පත්තකම්ම සූත්‍රයේ දැක්වෙන එක් කරුණක් නම්,
(1) කම්මකාර බලි
(2) පුත්තදාර බලි
(3) පුබ්බපේත බලි
(4) මිත්ත බලි
(5) පූජා බලි

**48.** පහත දැක්වෙන ප්‍රකාශවලින් බුදුදහමට අනුව නිවැරදි වන්නේ කුමක් ද?
(1) ආදි බමුණන් අතර ද ධ්‍යාන භාවනා කිරීම සිදු වී ඇත.
(2) සමථ භාවනාව පැවිද්දන්ට අදාළ නැත.
(3) කවර අරමුණක වුව සිත එකඟ කර ගැනීම භාවනාවයි.
(4) භාවනාව පුණ්‍ය ක්‍රියාවක් නොවේ.
(5) ත්‍රිලක්ෂණය හා භාවනාව අතර සම්බන්ධයක් නැත.

PAST PAPERS WIKI

[හත්වැනි පිටුව බලන්න.

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

**49.** යෝගාවචරයාගේ චරිත ලක්ෂණ විග්‍රහ කෙරෙන විශුද්ධි මාර්ගයට අනුව 'බුද්ධි' චරිතයාගේ ලක්ෂණ වන්නේ,

(1) ප්‍රිය අරමුණුවල ඇලෙන, මායා, සාඨෙය්‍ය ගුණවලින් යුක්ත වන බවයි.
(2) විසම ඉරියව් ඇති, රළු කටුක ආහාර ප්‍රියකරන බවයි.
(3) ථීන මිද්ධ, උද්ධච්ච කුක්කුච්ච ලක්ෂණවලින් යුක්ත වන බවයි.
(4) සිහිනුවණින් වෙසෙන, වීර්ය සම්පන්න අධික නුවණින් යුක්ත වන බවයි.
(5) සමූහයට කැමති, ස්ථිර සිතක් නැති ලක්ෂණවලින් සමන්විත වන බවයි.

**50.** සතර ඉරියව්වෙහි ම සතිමත්ව කටයුතු කිරීම කායානුපස්සනාව නම් වේ. එහි ඇතුළත් ඇවිදයාමට අදාළ වන 'වීතිහරණ' යන්නෙන් අදහස් වන්නේ,

(1) බිම තැබූ පාදය එසවීමයි.
(2) පාදය කිසිවක නොගටා පසෙකින් ඉදිරියට යැවීමයි.
(3) පය තැබූ තැන ඉක්මවා ඉදිරියට ගෙන යාමයි.
(4) පය බිමට පහත් කිරීමයි.
(5) පය බිම තබා තද කිරීමයි.

* * *

PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi
Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Papers Library